





# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

## මධ්‍යම පළාත

# *කාර්යය සාධන වාර්තාව 2022*



## "ගෙවන බද්ද මැද රටේ සංවර්ධනයටයි"

---


**පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**
අංක 244, කටුගස්තොට පාර, මහනුවර.

දු.ක. : 0812213022
ෆැක්ස් : 0812213033
ඊමේල් : info@revenue.cp.gov.lk
cpcrevenue@gmail.com
වෙබ් අඩවිය : revenue.cp.gov.lk

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (මධ්‍යම පළාත)

## 1. හැඳින්වීම

### 1.1. දැක්ම

මධ්‍යම පළාතේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක්

### 1.2. මෙහෙවර

ව්‍යවස්ථාපිත ආදායම් මූලාශ්‍ර තුලින් ආදායම් රැස්කිරීමත්, බදු හා ගාස්තු ගෙවිය යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමත්, ඒ සම්බන්ධයෙන් විනිවිදභාවයෙන්, සමානාත්මතාවයෙන් හා සාධාරණව කටයුතු කිරීමෙන්, මධ්‍යම පළාතේ ආදායම වැඩි දියුණු කිරීම මගින් පළාත් වාසීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

### 1.3. අරමුණු හා කාර්යයන්

**අ)** ආදායම් ඉලක්ක සපුරා ගැනීම

1. 2022 වර්ෂයේ දී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල් මිලියන 1750 ක් එකතු කිරීම
2. ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද රුපියල් මිලියන 3.5ක් එකතු කිරීම
3. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ආදායම් රැස්කිරීම

**ආ)** නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම.

**ඇ)** වෘත්තීය නිපුණතාවය දියුණු කිරීම

**ඈ)** තොරතුරු තාක්‍ෂණයේ සංවර්ධනය

**ඉ)** තෙවන පාර්ශවයන් දැනුවත් කිරීම

**ඊ)** යහපාලනය

## 1.4. මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ගැන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද දහතුන්වන සංශෝධනය මගින් පළාත් සභාව නම් වූ පරිපාලන ඒකකය ආරම්භ වූ අතර, මෙම පළාත් සභාවන් හී ආදායම් කටයුතු සම්බන්ධ කාර්යභාරයන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ 36 වන වගන්තිය යටතේ 36:1 සිට 36:20 දක්වා ඇති උප වගන්ති මගින් පළාත් සභාවන්ට අදාල වූ ආදායම් ප්‍රභවයන් හඳුන්වා දී ඇත. ඉහත නෛතික විධිවිධානයන්ට අනුකූලව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් සම්මත කර ගන්නට යෙදුණු 1990 අංක 17 දරණ මුදල් ප්‍රඥප්තියේ නෛතික රාමුව තුළ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත.

ඉහත කී මුදල් ප්‍රඥප්තිය මගින් හා 1996 අංක 03 දරණ මධ්‍යම පළාත් මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය යන ප්‍රඥප්ති මගින් පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ ඍජු පරිපාලනයට යටත්ව බදු හා ගාස්තු මෙන්ම පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය යුතු බදු හා ගාස්තු වර්ග දක්වමින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ විෂය පථය හඳුන්වා දී ඇත. පහත සඳහන් ආදායම් ශීර්ෂ මෙම ප්‍රඥප්ති මගින් දක්වා ඇත.


- පිරිවැටුම් බද්ද
- මුද්දර ගාස්තුව
- ඔට්ටු බද්ද
- ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද
- මෝටර් ප්‍රවාහන පනත යටතේ ගාස්තු දණ්ඩන හා බලපත්‍ර ගාස්තු
- අධිකරණ දඩ හා ගාස්තු
- මධ්‍යම පළාත් ලොතරැයි පිළිබඳ බදු
- ඉඩම් හා ගොඩනැගිලි බද්ද
- ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් සඳහා ගාස්තු
- සුරාබදු ආදායම
- වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ වූ ගාස්තු
- පඩි හා මිම් ආඥාපනත යටතේ ගාස්තු
- තෑගි තරග බද්ද

වර්තමානයේ පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ ඍජු පරිපාලනය යටතේ ක්‍රියාත්මක වන බදු හා ගාස්තු

1. මුද්දර ගාස්තු - 1991 සිට ක්‍රියාත්මක වේ.
2. ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද - 2014 (2) කාර්තුවේ සිට ක්‍රියාත්මක වේ.
3. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ගාස්තු - 2015 නොවැම්බර් සිට ක්‍රියාත්මක වේ.
4. පිරිවැටුම් බද්ද -1991 සිට 2010 (4) කාර්තුව දක්වා වූ හිඟ පිරිවැටුම් බදු පමණි.

1.5.

**සංවිධාන ව්‍යුහය - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**



## 1.6. කාර්ය මණ්ඩල තොරතුරු

2022-12-30 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව හා සිටින සංඛ්‍යාව

| තනතුර | අනුමත සංඛ්‍යාව | වැ. කේ. | සිටින සංඛ්‍යාව | සෘජු බඳවා ගැනීමේ අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| ආදායම් කොමසාරිස් | 1 | SL-1 | 1 | |
| නියෝජ්‍ය ආදායම් කොමසාරිස් | 1 | SL-1 | 1 | |
| තක්සේරුකරු | 14 | SL-1 | 14 | පිළිගත් විශ්ව විද්‍යාලයක පළමු හෝ 2වන පන්තියේ උපාධියක් / වරලත් හෝ එකාබද්ධ ගණකාධිකාරීන් |
| බදු නිලධාරී | 22 | MN-5 | 17 | පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක්, / වරලත් ගණකාධිකාර ආවසරික2/ CIMA 3වන මට්ටම |
| සංවර්ධන නිලධාරී | 12 | MN-4 | 17 | |
| කළමනාකරණ සේවා නිලධාරී | 6 | MN-2 | 6 | |
| රියදුරු | 3 | PL-III | 3 | |
| කාර්යාල කාර්ය සහායක | 4 | PL-I | 4 | |
| | | | | |
| **එකතුව** | **63** | | **63** | |

ඉහත සටහනේ දැක්වෙන පුරප්පාඩු තනතුරු වලට නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන මෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් කර ඇති අතර රජය විසින් ගෙන ඇති නව බඳවාගැනීම් අත්හිටුවීමේ තීරණය මත මෙතෙක් බඳවාගැනීම් සිදුකර නැත. නිලධාරී ඌනතාවයට තාවකාලික පිලියමක් ලෙස ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් සංවර්ධන නිලධාරීන් 5 දෙනෙක් මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත.

## 2. 2022 වර්ෂයේ සැලසුම් කරන ලද කාර්යයන් හා ඉටුකළ කාර්යයන්

### 2022 වර්ෂය තුළදී අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය


| ආදායම් ප්‍රභවය | | වාර්ෂික ආදායම් ඉලක්කය රුපියල් | 2022 වර්ෂය තත්‍ය ආදායම රුපියල් | ළඟා වීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | මුද්දර ගාස්තු<br>අයවැයෙන් ලබා දුන් ඉලක්කය | 1,750,000,000 | 2,266,613,096 | **130%** |
| 02 | බනිජ අයිතීන් පිළිබඳ බද්ද<br>අයවැයෙන් ලබා දුන් ඉලක්කය<br>දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කය | 5,000,000<br>3,500,000 | 3,791,568<br>3,791,568 | **75%**<br>**108%** |
| 03 | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය<br>• බලපත්‍ර ගාස්තු හා ලියාපදිංචි ගාස්තු<br>අයවැයෙන් ලබා දුන් ඉලක්කය<br>දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කය | 6,000,000<br>3,500,000 | 5,420,000*<br>3,520,000 | **90%**<br>**100%** |
| 04 | වෙනත් ආදායම්<br>මත ලබාදීමේදී අය කරන ගාස්තු | - | 306,250 | |
| | **එකතුව**<br>අයවැයෙන් ලබා දුන් ඉලක්කය<br>දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කය | 1,761,000,000<br>1,757,500,000 | 2,274,230,914<br>2,274,230,914 | **129%**<br>**129%** |

* පළාත් සභා අය වැය ඇස්තමේන්තුවේ බඩු උකස් ගන්නන්ගෙන් අයකරන ගාස්තු යටතේ ආදායම් ඉලක්ක ලබාදීමේ දී ඇප තැන්පතු ද ආදායමක් ලෙස සලකා ඇති බැවින් ඇප තැන්පත් ද ඇතුලත්ව ගාස්තු මෙලෙස දක්වා ඇත. මුළු එකතුව සඳහා ඇප තැන්පත් අතහැර ගණනය කිරීම සිදුකර ඇත.

## 2022 වර්ෂයේ ඉටුකළ කාර්යයන්

### අ) 2022 වර්ෂයේ දී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල් මිලියන 2,266 ක් එකතු කිරීම

2012 වසරේ සිට 2022 වසර දක්වා දෙපාර්තමේන්තුව රැස් කල මුද්දර ගාස්තු ආදායම විශ්ලේෂණය කිරීමේ දී පහත 01 රූප සටහනට අනුව 2019 වසරේ සිදුවූ පාස්කු ප්‍රහාරයත් සමග රටේ ඇතිවූ අයහපත් වාතාවරණය මෙන්ම ඉන්පසුව ගෝලීය කොවිඩ් 19 වසංගත තත්වය මත රටේ ආර්ථිකයේ ඇති වූ පසුබෑම මුද්දර ගාස්තු ආදායම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති අන්දම මනාව පැහැදිලිවේ. 2020 වසරේ අගභාගය වන විට කොවිඩ් 19 වසංගත තත්වයේ පාලනය හමුවේ නැවත රටේ ආර්ථික තත්වය යහපත් අතට හැරීමත් සමග මුද්දර ගාස්තු ආදායමේ ද කැපී පෙනෙන වර්ධනයක් සිදුවුව ද 2021 වසර අවසානය වනවිට විදේශ විනිමය අර්බුදය මත රටේ උද්ගත වූ ආර්ථික, දේශපාලනික අස්ථාවරත්වය නැවත මුද්දර ගාස්තු ආදායම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. එම අර්බුදකාරී වාතාවරණය සැලකිල්ලට ගනිමින් 2022 වසරේ පළාත් සභාවේ අය වැය ඇස්තමේන්තුවෙන් දෙපාර්තමේන්තුව සඳහා ලබා දුන් මුද්දර ගාස්තු ආදායම් ඉලක්කය ද රුපියල් මිලියන 1750ක් ලෙස පහත දමා තිබුණි.




රූප සටහන 01: 2012 වසරේ සිට 2022 වසර දක්වා රැස්කල මුද්දර ගාස්තු ආදායම රුපියල් මිලියන වලින්

පවත්නා ආර්ථික අර්බුදය හමුවේ රටේ බැංකු පද්ධතියට එල්ලවී අති තර්ජනය හේතුවෙන් ආයෝජනයක් ලෙස දේපල මිලදී ගැනීම් ඉහළ යාමේ ප්‍රවණතාවයක් දැකිය හැකි අතර මුද්දර ගාස්තු ආදායමේ වර්ධනයට එයද පිටිවහලක් වී ඇත. කෙසේ වුවද බදුගෙවන්නන් සම්මුඛ සාකච්ඡා කැඳවීම, දේපල ස්ථාන සමීක්ෂණය කිරීම, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ආදී රාජකාරි කටයුතු දැඩි ලෙස සීමා කිරීම් මධ්‍යයේ වුවද මනා සැලසුමකින් යුක්තව රාජකාරි කටයුතු සංවිධානය කරමින් මාර්ග ගත ක්‍රමය තුළින් හා නිවසේ සිට රාජකාරි කිරීමේ ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ආදායම් ඉලක්ක අභිබවා 130% ක වර්ධනයක් සමග රුපියල් මිලියන 2,266ක ආදායමක් රැස්කරගැනීමට හැකිවීම දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයකි. 2022 වසර තුල නිලධාරීන්ගේ සෘජු මැදිහත්වීම මත එකතුකරන ලද අතිරේක මුද්දර ගාස්තු ප්‍රමාණය රු. 118,772,593.00කි. මෙය පසුගිය වසරට සාපේක්ෂව 48%ක වර්ධනයකි. පවත්නා අධික උද්ධමනකාරී වාතාවරණය තුල බදු හා ගාස්තු ගෙවන ජනතාව පීඩාවට ලක් නොකර ආදායම් ඉලක්ක සපුරා ගැනීමට හැකිවීම සුවිශේෂී තත්වයකි.

### ආ) බනිජ අයිතීන් පිළිබඳ බද්ද රුපියල් මිලියන 3.7ක් එකතු කිරීම

විදේශ සංචිත හීන වීම මත 2022 වසරේ ඇති වූ ආර්ථික අර්බුදයත් සමග ඉදිකිරීම් ක්ෂේත්‍රයේ භාණ්ඩ ආනයනය දැඩි ලෙස සීමා කිරීමත්, අධික ලෙස ඉහල ගිය උද්ධමනයත් හේතුකොට ගෙන ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දැඩි පසුබෑමක් ඇතිවිය. මෙය බනිජ ආශ්‍රිත ව්‍යාපාරයට සෘජුව බලපෑ අතර එම තත්වය යටතේ බනිජ බදු ආදායම රැස්කිරීම ද විශාල අභියෝගයක් විය. එම අභියෝගයට සාර්ථකව මුහුණ දෙමින් 2022 වසර සඳහා දෙපාර්තමේන්තු ක්‍රියාකාරි සැලැස්මට අනුව ලබාදුන් ඉලක්කය සපුරා ගනිමින් රුපියල් 3,791,568.00 ක බනිජ බදු ආදායමක් රැස්කර ගත හැකිවූ අතර එය අයවැයෙන් ලබා දුන් ඉලක්කය 75%කින් ළඟා වීමකි.

### ඇ) බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ආදායම්

බඩු උකස් ගන්නා ව්‍යාපාර අළුතින් ආරම්භ කිරීමේ දී පමණක් ඇප තැන්පත් මුදලක් ලබා ගන්නා අතර එය ආදායමක් සේ නොසලකයි. දෙපාර්තමේන්තුව මගින් අයකරනු ලබන්නේ බඩු උකස් ගන්නා ව්‍යාපාර වලින් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් බැවින් එම ආදායමේ සැලකිය යුතු වර්ධනයක් වාර්ෂිකව අපේක්ෂා කල නොහැකිය. එබැවින් 2022 පළාත් සභා අය වැයෙන් ලබා දී තිබූ ඉලක්කය ළඟා කරගැනීම අසීරු වුවද දෙපාර්තමේන්තු ක්‍රියාකාරි සැලැස්මට අනුව ලබාදුන් ඉලක්කය සපුරා ගතහැකි විය.

### ඈ) නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම.

පහත සඳහන් යෝජනා මේ වන විට ඉදිරිපත් කර ඇති අතර, පළාත් සභා විසුරුවා හැර තිබීම හේතුවෙන් ඒ සම්බන්ධ ඉදිරි කටයුතු මෙතෙක් සිදුවී නොමැත.

1. ඖෂධ හා රසායන වෙළඳ බලපත්‍ර බදු ප්‍රඥප්තිය
2. මෝටර් රථවාහනයක අයිතිය පැවරීමේ මුද්දර ගාස්තුව
3. කාර්තුවක පිරිවැටුම රු.මිලියන 30 ට අඩු ව්‍යාපාර සඳහා පිරිවැටුම් බද්ද

### ඉ) වෘත්තීය නිපුණතාවය දියුණු කිරීම

- 2022 වර්ෂය තුළ රටේ පැවති අයහපත් ආර්ථික වාතාවරණය තුල රජයේ ආයතන වලට ලබා දෙන ප්‍රතිපාදන විශාල වශයෙන් සීමා කිරීම හේතුවෙන් පුහුණු වැඩමුළු පැවැත්වීමට නොහැකි වූ අතර ප්‍රධාන අමාත්‍යාංශයේ පුහුණු ඒකකය මගින් පවත්වනු ලැබූ වැඩමුළු සඳහා නිලධාරීන් යොමු කරන ලදී.

### ඊ) තොරතුරු තාක්‍ෂණයේ සංවර්ධනය

- Web-based පරිගණක වැඩසටහන හා E-file Management System එක උපයෝගී කරගෙන රාජකාරී කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීමට සෑම උත්සාහයක්ම දරා ඇත.

### උ) තෙවන පාර්ශවයන් දැනුවත් කිරීම

- නව Web-based පරිගණක වැඩසටහනට ගැලපෙන සේ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය නවීකරණය කර යාවත්කාලීනව පවත්වාගෙන යාමෙන් ආකෘති පත්‍ර හා දැන්වීම් මගින් බදු ගෙවන ජනතාව දැනුවත් කිරීමටත් අවශ්‍ය ආකෘති පත්‍ර බාගත කර ගැනීමටත් අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත.

## 2022 ක්‍රියාකාරි සැලැස්ම සැලසුම අනුව කාර්ය සාධනය

| අරමුණ | අංශය | කාර්යයන් | ඉලක්කය | ළඟාවීම |
|---|---|---|---|---|
| 1. ආදායම් ඉලක්ක සපුරා ගැනීම | මුද්දර අංශය රු.මිලි.1750 | **ආදායම රු.මිලියන** | **1,750** | **2,266** |
| | | 1. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් සෘජුව ලැබෙන තොරතුරු අංශ අනුව බෙදාහැරීම<br>2. අදාල කාර්යාලවලට ගොස් තොරතුරු රැස්කිරිම හා බැංකු මගින් ලැබෙන තොරතුරු<br>3. මෙම ලබාගත් තොරතුරු අදාල අංශ අනුව බෙදා හැරිම | 30000 | 34678 |
| | | 4. තොරතුරු ලේඛනයට අනුව ගොනු ආරම්භ කිරිම | 10000 | 11836 |
| | | 5. ගොනු සඳහා සාධන පත්‍ර කැඳවීම. | 10000 | 11836 |
| | | 6. ගොනු විශ්ලේෂණය කිරිම.(ආකෘති පත්‍ර 300,101 හා 190 මගින්) | 9000 | 12378 |
| | | 7. සාධන පත්‍ර නොලැබුණු ගොනු හඳුනා ගැනීම. | | |
| | | 8. i. ගෙවූ ගාස්තු ප්‍රමාණවත් නම් ගොනුව අවලංගු කිරිම. | | 6288 |
| | | ii. මතය ලබා දීමේදී සහ ගෙවීම් ප්‍රමාණාත්මක නොවන්නේ නම් සම්මුඛ සාකච්ඡා කැඳවා අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම හෝ එකතු නොවනවිට ස්ථාන පරීක්ෂණ සිදුකර හෝ අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම | රු.මිලි.70 | රු.මිලි.118.7 |
| | | iii. දේපල තක්සේරු කිරීමේ කාර්යය සඳහා සිදුකිරීමට අපේක්ෂිත ස්ථාන පරීක්ෂණ සංඛ්‍යාව. | 500 | 55 |
| | | iv. සම්මුඛ සාකච්ඡා සඳහා කැඳවීම් ගොනු සංඛ්‍යාව | 3000 | 3109 |
| | | 9. තක්සේරු දැන්වීම් නිකුත් කිරිම සහ තක්සේරු සහතික (මත) නිකුත් කිරීම | 1500 | 2006 |
| | | 10. අභියාචනා /විරෝධතා විසඳීම.(ලැබෙන සියල්ල) | | |
| | | 11. තක්සේරු දැන්වීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 30 | 26 |
| | | 12. තොරතූරු නොසැපයීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 100 | 59 |
| | ඛනිජ අයිතීන් පිළිබඳ බදු අංශය රු.මිලි. 3.5 | **ආදායම රු.මිලියන** | **3.5** | **3.6** |
| | | 1. ඛනිජ බදු වාර්තා නිකුත් කිරිම | 3500 | 1685 |
| | | 2. වාර්තා පරීක්ෂා කර ස්වතක්/නිදහස් ලකුණු කිරිම | 1500 | 2027 |
| | | 3. ලිපිගොනු ආවේක්ෂණය කිරිම | 2000 | 1460 |
| | | 4. තක්සේරු දැන්වීම් හෝ අතිරේක තක්සේරු නිකුත් කිරිම | 20 | 49 |
| | | 5.ඛනිජ බදු ගෙවීම්පත් දත්ත පරිගණක ගත කිරීම | සියල්ලම | සියල්ලම |
| | | 6. වාර්තා නොසැපයීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 25 | 3 |
| | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය - ගාස්තූ හා තැන්පතූ රු.මිලි. 3.5 | 1. වාර්ෂික බලපත්‍ර ගාස්තූ | **රු.මිලි. 3.5** | **රු.මිලි.3.5** |
| | අය හා හිඟ බදු අංශය | 1. අභියාචනා /විරෝධතා විසඳීම<br>ඉදිරිපත් කර ඇති සියලුම අභියාචනා විසඳා අවසන් කිරීම | සියල්ලම | සියල්ලම |
| | | 2. පැහැර හැරි තැනැත්තන්ගේ ස්ථානවලට ගොස් හිඟ බදු/ ගාස්තු එකතු කිරිම (D 7) | 200 | 196 |
| | | 3. නොගෙවූ හා එකඟතාවයකට නොපැමිණෙන අය වෙනුවෙන් නීතිමය පියවර ගැනීම. | | 2 |
| | | 4. ගෙවීම් පත්වල දත්ත පරිගණක ගත කිරිම | සියල්ලම | සියල්ලම |
| | | 5. අගරු චෙක්පත් පිළිබඳව ප්‍රමාදයකින් තොරව කටයුතු කිරීම | | |

| | | | | |
|---|---|---|---|---|
| | තෙවන පාර්ශ්වයන් දැනුවත් කිරීම | 1. අදාළ ස්ථානවල ප්‍රදර්ශනය සඳහා දැන්වීම් සකස් කිරීම හා ප්‍රදර්ශනය කරවීමට සැලැස්වීම<br>2. පුවත්පත් දැන්වීම් පල කිරීම<br>3. දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම<br>4. වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම | | දැනුවත් කිරීමේ දැන්වීම් පුවරු සකස් කර ප්‍රදර්ශනය කර ඇත |
| 2. නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම. | | 1. නීති අධ්‍යයනය කිරීම හා පවතින ප්‍රභවයන් මොනවාදැයි අධ්‍යයනය කිරීම.<br>2. එම ප්‍රභවයන් පිළිබඳ සම්භාව්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම.<br>3. ක්‍රියාත්මක කිරීමට, වඩා සුදුසු ආදායම් ප්‍රභවයන් තීරණය කිරීම.<br>4. හඳුනාගත් නව ආදායම් උත්පාදන ක්‍රම යෝජනා අනුමැතිය සඳහා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම<br>5. ක්‍රියාත්මක කිරීම | 1 | දැනටමත් ඉදිරිපත් කර ඇත |
| 3. ධාරිතා සංවර්ධනය | කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය | 1. වෘත්තීය පුහුණු අවශ්‍යතා ක්ෂේත්‍රයන් හඳුනාගැනීම<br>2. පාඨමාලා ක්‍රමවේදයක් සකස් කිරීම.<br>3. සම්පත් දායක පුද්ගලයන් සහ ආයතන හඳුනාගැනීම.<br>4. පිරිවැය හඳුනාගැනීම. | | නිලධාරීන් පුහුණු වැඩමුළු සඳහා යොමු කර ඇත |
| | තොරතුරු තාක්ෂණයේ සංවර්ධනය | 1. කාර්යක්ෂම, ආරක්ෂාකාරී තොරතුරු පද්ධතියක් සැකසීම<br>2. කාලීන අවශ්‍යතා අනුව යාවත්කාලීන කිරීම | | ක්‍රියාවට නංවා ඇත |
| 4. යහපාලනය | | 1. ආයතනයේ කාර්යසාධන මට්ටම ඉහළ නැංවීම<br>2. රාජ්‍ය නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක කිරීම<br>3. පැමිණිලිවලින් තොර වූ ආයතනයක් ඇති කිරීම | | සාර්ථක මට්ටමේ පවතී |

ඉහත සියලුම දත්තයන් නිලධාරීන්ගේ දෛනික, මාසික, අර්ධ වාර්ෂික, වාර්ෂික ප්‍රගති වාර්තා සියල්ල පරීක්ෂා කිරීමෙන් ලබාගෙන ඇති අතර ඒ අනුව ඉහත වගුව සකස්කර ඇත.

## 2.2 ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන

2022 වර්ෂයේදී ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන යටතේ සැලසුම් කරන ලද ක්‍රමෝපායන් අනුව කාර්යාලයීය කටයුතු ඉටු කිරීමට උපරිම උත්සාහයක් දරන ලදී.

**අභියෝග**

ලොව පුරා පැතිරුණු කොවිඩ් 19 වසංගත තත්වයේ පාලනය හමුවේ නැවත රටේ ආර්ථික තත්වය යහපත් අතට හැරීමත් සමග 2021 වසරේ දී මුද්දර ගාස්තු ආදායමේ ද කැපී පෙනෙන වර්ධනයක් සිදුවුව ද එම වසර අවසානය වනවිට විදේශ විනිමය අර්බුදය මත රටේ උද්ගත වූ ආර්ථික, දේශපාලනික අස්ථාවරත්වය නැවත බදු හා ගාස්තු ආදායම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. එම අර්බුදකාරී වාතාවරණය හමුවේ 2022 වසරේ නැවත රාජ්‍ය ආයතන ද වරින් වර වසා දැමීමට සිදුවීමත්, රාජ්‍ය නිලධාරීන් සේවයට කැඳවීම සීමා කිරීම වැනි ක්‍රියාමාර්ග යටතේ වුවද මාර්ග ගත ක්‍රමය යටතේ ද රාජකාරී කටයුතු වල යෙදෙමින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැක්වූ කැපවීම මත අපේක්ෂිත ආදායම් ඉලක්ක අභිබවා ආදායම් රැස්කර සමස්ථ ආදායම වූ රුපියල් මිලියන 2,274 ක ආදායමක් පළාත් සභාවට රැස්කර දීමට හැකිවීම දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයකි. එහිදී පළාතේ මහජනතාව, ව්‍යාපාරික ප්‍රජාව, ඉඩම් රේජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව, නොතාරිස් හා නීතිඥ මහත්ම මහත්මීන්, මහජන බැංකුව, ලංකා බැංකුව හා පොලීසිය, අධිකරණ සහ වෙනත් රජයේ ආයතන මෙන්ම ගරු ආණ්ඩුකාරතුමා ඇතුළු කාර්යය මණ්ඩලයෙන්, ප්‍රධාන ලේකම්තුමා ඇතළු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගයද කෘතඥතා පූර්වකව සඳහන් කර සිටිමි.

රටේ වත්මන් ආර්ථික වාතාවරණය ද 2022 වසරේ දී ලද අත්දැකීම් ද සැලකිල්ලට ගනිමින් සකස් කරන ලද 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින්, රජයේ ප්‍රතිපත්ති වලට අනුගත වෙමින්, පළාතේ ජනතාව අපහසුතාවයට පත් නොවන සේ විවිධ ක්‍රමෝපායන් අනුගමනය කරමින් අපේක්ෂිත ආදායම් ඉලක්ක ළඟාකර ගනිමින් මධ්‍යම පළාත් සභාවේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක් ලබාදීම අපගේ අරමුණයි.

**ස්තුතියි,**

(සී. ඒ. සුගතදාස)
පළාත් ආදායම් කොමසාරිස්
මධ්‍යම පළාත